# රිලා කතා



ඉසුරින්දි ද අල්විස්

පොතේ නම :-රිලා කතා

කර්තෘ :- ඉසුරින්දි ද අල්විස්.

ISBN :- 978-624-206-804-6

කෘතිය පළ කරන දිනය :-15.11.2023

කර්තෘගේ වෙනත් කෘති :- මගේ යාළුවා

කඩුපුල් මල් කුමාරි

The Meeting.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 . 11 . 01

අපේ රටේ ජනතාව කරදරකාරී සතෙකු ලෙස සලකන රිලවු ගැන මා දන්නා රසවත් කතා බොහෝමයක් ඇත.

මේ ඒවාගෙන් කිහිපයකි.

මේ හොඳින් ඉර පායා ඇති උදෑසනකි. අම්මාත්, තාත්තාත්, මමත් දළදා සමිඳු වැඳීමට යමින් සිටියා."

මෙන්න වැඩක්" මිනිසුන් රැසක් උස ගොඩනැගිල්ලක් දෙස විමසිල්ලෙන් බලමින් කෑ කෝ ගසමින් සිටිනවා.

"මොකද අර සෙනඟ ගොඩක් එකතු වෙලා උඩ බලාගෙන ඉන්නේ." අම්මා ඇසුවා.

"අනේ මන්දා අපි ඉක්මනට ගිහින් බලමු"

අප මිනිසුන් සිටින තැනට ඉක්මනින් ඇවිදගෙන ගියා.

මෙන්න පුදුමයක් !

අර උස ගොඩනැගිල්ලේ ඉහළ සඳළුතලයේ රිලවෙක් ඉන්නවා.

පහළ කඩයෙන් හොරකම් කරගෙන ගිය ජම්බෝ පීනට් වැලක් එයා කරේ දාගෙන ඉන්නවා.

රිලා හාමිට ගානක් නැහැ. අර දිග මාලයෙන් පැකට් එක ගානේ කඩාගෙන රටකජු කනවා.

හරිම ලස්සනයි. බිම ඉන්න කට්ටිය කෑගසනවා. උසුලු විසුලු කරනවා. එයාට ගානක් නැහැ.

මගේ වැඩේ මම කරනවා.

අනිත් අයගේ දේවල් මට වැඩක් නැහැ. රිලා හාමි එහෙම හිතන්න ඇති.



.මේ රිලා කතාව අම්මලාගේ ආදරය මිනිස්සුන්ටත්, සත්තුන්ටත්, වෙනසක් නොමැති බව පෙන්වා දෙයි.

එදා පාසල් නිවාඩු දිනයක්. අපේ ගෙදර ඉදිරිපිට පාසලේ පිට්ටනියේ මමත්, මල්ලිත් සෙල්ලම් කරමින් සිටියා. පිට්ටනියේ කෙලවරක තිබෙන වතුර වලේ වතුර පිරී තිබුණා.

"පුතේ වලේ වතුර පිරිලා. ඒ පැත්තට යන්න එපා." කියමින් අම්මා කෑ ගසමින් කිවුවා.

ටික වෙලාවකින් රිලවු රංචුවක් පාසල් වත්තේ අඹ ගහ උඩට පැන ගත්තා. එම රංචුවේ පොඩි රිලවු පැටවුනුත් ලොකු රිලවුනුත් සිටියා.

අඹ ගසේ ගෙඩි බිම දමමින් ටික වේලාවක් සෙල්ලම් කරමින් සිටි රිලා පැටවු ටික බිමට පැනගත්තා. උන් කෑ ගසමින් වල දෙසට ගියා. පසුව පැටවු ටික වතුර වලට පැන සතුටින් නැටුවා.

මේ දෙස බලා සිටි රිලා අම්මා යැයි සිතිය හැකි ලොකු රිලවියක් ගසින් ඉක්මනින් බැස්සා. එයාගේ මූණ තරහ පාටයි. අපටත් බය හිතුණා.

ඒ වුණාට රිලා අම්මා අප දිහාවත් නොබලා වතුර වල ළඟට පැන ගත්තා.

වතුරේ නටමින් සිටි පැටව් එකිනෙකා උඩට ගත්තා.

හයියෙන් කෑගසමින් පහර කිහිපයක් ගැසුවා. පැටවු ටික ආයෙත් රංචුවට එකතු වුණා.

රිලා අම්මා කිසිවක් සිදු නොවූ ලෙස සෙමින් ආපසු ආවා. (අම්මලාගේ ආදරේ තරම)



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01